

පරිසරය

අලි ඇතුන් නරඹන්නට නොවරදින තැනක්

# උඩවලව ජාතික වනෝද්‍යානය

යු.පී.එස්.පතිරණ

**දැනට ශීඝ්‍රයෙන් වඳවීයාමේ තර්ජනයට ලක්වී ඇති ශ්‍රී ලංකාවේ විශාලතම ක්ෂීරපායි සත්වයා අලියාය. විශේෂයෙන් මිනිසුන් විසින් අලි ඇතුන්ගේ සම්ප්‍රදායික නිජබිම වූ ස්වාභාවික වනාන්තර ආක්‍රමණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැන නැගී ඇති අලි මිනිස් ගැටුම් නිසා 1997 - සිට 2001 දක්වා පමණක් වියළි කලාපයේ අලි ඇතුන් 741 ක් අවසන් හුස්ම හෙලා ඇති බව පැවසේ.**


පසුගිය සියවස ආරම්භයේ දී ගණන් බලා තිබූ ආකාරයට අලි ගහණය 20,000 ක් පමණ වූ නමුදු අද අලිගහණය ආසන්න වශයෙන් 2500 ක් පමණ දක්වා පහළ බැස තිබීම කිසිසේත් සතුටට කරුණක් නොවේ. කෙසේ වුවද වනයේ ඇවිද අලි ඇතුන් රංචු පිටින් දැකබලාගත හැකි වන අභයභූමි කිහිපයක් තවමත් ඉතිරිවී තිබීම වාසනාවකි. ඒ අතර උඩවලව ජාතික වනෝද්‍යනයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි.

වලවේ ගඟ සංවර්ධන ව්‍යාපාරය හේතුවෙන් ඇතිවූ උඩවලව ජාතික වනෝවද්‍යානය රත්නපුර හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකටම මායිම්ව පිහිටා තිබේ. වලවේ ගඟ හරස්කර ඉදිකරන ලද හෙක්ටයාර් 3400 ක භූමි ප්‍රමාණයක් වසා පැතිරුණු උඩවලව ජලාශය නිසා අවතැන්වූ වන සතුන්ට රැකවරණය ලබාදීම පිණිසත් උඩවලව ජලාශයේ ජල පෝෂක ප්‍රදේශය ආරක්ෂා කිරීම සඳහාත් ආරම්භ කරන ලද මෙම වනෝද්‍යානය හෙක්ටයාර් 30281 ක භූමි ප්‍රමාණයකින් සමන්විත වේ. මෙම වනෝද්‍යානය ආරම්භ කරන ලද්දේ 1972 වර්ෂයේය.

උඩවලවේ ජාතික වනෝද්‍යානයට රත්නපුර හා පැල්මඩුල්ල හරහාද ගමන්කළ හැකිය. පැල්මඩුල්ල ඇඹිලිපිටිය මාර්ගයේ තිඹොල්කැටිය හන්දියෙන් වමට හැරී තනමල්විල මාර්ගය ඔස්සේ යන විට උඩවලව වනෝද්‍යානය හමුවේ.

වනෝද්‍යානයට ඇතුළුවීමේ දොරටුව පිහිටා ඇත්තේ තිඹොල්කැටිය තනමල්විල මාර්ගයේ 7 වන සැතපුම්කණුව ආසන්නේය. කොළඹ සිට වනෝද්‍යානයට ඇති දුර කිලෝ මීටර් 165 ක් වන අතර, කොළඹට ආසන්නව පිහිටි වනෝද්‍යානයද උඩවලව වනෝද්‍යනය වේ.

උඩවලවේ වනෝද්‍යාන භූමිය සාමාන්‍යයෙන් තැනිතලා භූමියක් වුවද, එම තැනිතලා භූමියේ තැනින් තැන කුඩා කඳුගැට කිහිපයක්ද මතුවී තිබේ.



උතුරින් පිහිටි කල්තොට කඳු වැටිය හා දියවත්තා ඇල්ල වනෝද්‍යානයේ සුන්දරත්වය තවත් ඉස්මතු කරලත්තකි.වියළි කලාපයේ පිහිටි ද්විතියික වනාන්තරයක් වන උඩවලව වනෝද්‍යනය ආර්ථික හා ඖෂධීය වටිනාකමින් යුතු ශාක රැසකටද නිජබිම වේ. වනයේ උසට වැඩුණු කළුවර, බුරුත, හල්මිල්ල, මිල්ල, කුඩුමැල්ල, ශාක මෙන්ම නෙල්ලි, බුළු වැනි ඖෂධීය වටිනාකමින් යුතු ශාකද ඒ අතර වේ.

පඳුරු ශාක මෙන්ම ඉලුක්මාතා වැඩුණු තැන් තැනිතලා පමණක් නොව දකුණු මායිමේ තේක්ක වගාවකින්ද සමන්විතය.

**ශ්‍රී ලංකාවට ආවේණික කොස්ඇට මීයාද ඇතුළු මීයන් වර්ග 05 ක් ද මුගටි විශේෂ 05 ක්ද, සර්ප විශේෂ 30 ක්ද විවිධ මාදිලියේ සමනලුන් විශේෂ 50 කටද, උඩවලව වනෝද්‍යානය වාසය භූමිය වී ඇත. ගරා කටුස්සා, වැනි උරග විශේෂ මෙන්ම වියළි කලාපයට ආවේණික කටුසු විශේෂද කිඹුලා, කබරගොයා, තලගොයා ආදීන් මෙන්ම සර්ප විශේෂ 30 ක් පමණද මෙහි වෙසේ. උඩවලව වනෝද්‍යානය විවිධ වර්ගයේ පක්ෂීන් නැරඹීම සඳහාද කදිම භූමියකි. වලි කුකුළා, හබන් කුකුළා, අළු කැඳැත්තා, පරවැල් කුරුල්ලා, රතු මුහුණැති මල් කොහා වැනි ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශේෂවලටද උඩවලව වනෝද්‍යානය නිජබිමකි.**

ජෛව විවිධත්වය ගැන සැලකීමේ දීද උඩවලව වනෝද්‍යානය ඉතා ඉහළ මට්ටමක පවතී. මෙහි ප්‍රධානතම සත්ව සම්පත අලින්ය. 500 කට අධික අලි ගහනයකට උඩවලව වනෝද්‍යානය රැකවරණය සලසා දී තිබේ. වනාන්තර වල අතරමංවන අලි පැටවුන් ගෙනවුත් පෝෂණය කර නැවත වනයට මුදා හැරීමේ ව්‍යාපෘතියක් වන "ඇත් අකුරු සෙවන" පිහිටා ඇත්තේද උඩවලව වනෝද්‍යානය ආශ්‍රිතවය. මෙහි වෙසෙන දිවියාට අමතරව අඳුන් දිවියා, කොළ දිවියා, වලහා ආදී සතුන් සුළු වශයෙන් දැකිය හැකිය. ඒ අතර වල් ඌරා, කුළු හරකා, ගෝණා, තිත් මුවා, වැලි මුවා, මීමින්නා, හිවලා කලවැද්දා, වඳුරා, හාවා වැනි සතුන්ද සුලබව දැකිය හැකිය.



ශ්‍රී ලංකාවට ආවේණික කොස්ඇට මීයාද ඇතුළු මීයන් වර්ග 05 ක් ද මුගටි විශේෂ 05 ක්ද, සර්ප විශේෂ 30 ක්ද විවිධ මාදිලියේ සමනලුන් විශේෂ 50 කටද, උඩවලව වනෝද්‍යානය වාසය භූමිය වී ඇත. ගරා කටුස්සා, වැනි උරග විශේෂ මෙන්ම වියළි කලාපයට ආවේණික කටුසු විශේෂද කිඹුලා, කබරගොයා, තලගොයා ආදීන් මෙන්ම සර්ප විශේෂ 30 ක් පමණද මෙහි වෙසේ.

උඩවලව වනෝද්‍යානය විවිධ වර්ගයේ පක්ෂීන් නැරඹීම සඳහාද කදිම භූමියකි. වලි කුකුළා, හබන් කුකුළා, අළු කැඳැත්තා, පරවැල් කුරුල්ලා, රතු මුහුණැති මල් කොහා වැනි ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශේෂවලටද උඩවලව වනෝද්‍යානය නිජබිමකි. මෙහිදී දැකබලා ගත හැකි උකුසු හා රාජාලි විශේෂද ජලාශ්‍රිතව වෙසෙන දියකාවුන් හා කොකුන්ගේද දර්ශනය උඩවලව වනෝද්‍යානය තුළට පැමිණෙන ඔබගේ මනදෙල සපුරාලනු නිසැකය.සංචාරයන් සඳහා වනෝද්‍යානය තුළට පහසුවෙන් පිවිසීම සඳහා මාර්ග සකස්කර ඇති අතර, අවශ්‍ය වන්නේ නම් රාත්‍රී නවාතැන් ලබාගත හැකි සංචාරක නිවාස තුනක්ද මෙහි ඇත.

උඩවලව වනෝද්‍යානයට ඇතුළුවීමේ දී හැම අයෙකුගෙන්ම ගාස්තුවක් අය කෙරේ. වනෝද්‍යානය තුළ සපාරි චාරිකාවක් සඳහා ජීප්රථ සැපයීමට උඩවලව වනපෙත ජීප්රථ සංගමය පැහැදී සිටිති.

පැය එකහමාරක සපාරි චාරිකාවක් සඳහා අවම වශයෙන් ජීප් රථයකට රුපියල් 1200 ක මුදලක් අයකරනු ලබන අතර, වනෝද්‍යානය තුළට පිවිසෙන සැම වාහනයකටම වන මංපෙත්වන්නකු සැපයේ. සංචාරක නිවෙස් වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් වෙන්කරවා ගත හැකි අතර, ජීප් රථ වනෝද්‍යානයේ ප්‍රධාන දෙරටුව අසලදීම වනපෙත ජීප් රථ සංගමයෙන් ලබාගත හැකිය.

❑